# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2164/23 – 2020 පෙබරවාරි 26 වැනි බදාදා – 2020.02.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

2020 අංක 10 දරන ආඥාව

මගේ යොමු අංකය: 4-3/7/2019/HW/253.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ව/ප්‍රාලේ/1/3/4/2019/06.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 19 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර''
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි** – ප්‍රාදේශීය ලේකම්, වත්තල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 177, මත්තුමගල, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මත්තුමගල ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක GA/DSO/2019/644 හා 2019.12.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

1. කැබලි අක්ෂර '**A**' – **ජාවාගේ කොටුව – ප්‍රමාණය: හෙක්. 0.0566**
උතුරට: හිමිකම් කියන්නා සහ නම සොයාගත නොහැකි ඉඩම ; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය (මා.සං.අ.) ; දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: හිමිකම් කියන්නා සහ නම සොයාගත නොහැකි ඉඩම.

2. කැබලි අක්ෂර '**B**' – **ජාවාගේ කොටුව – ප්‍රමාණය: හෙක්. 0.0768**
උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර C ; නැගෙනහිරට: කැබලි අක්ෂර C ; දකුණට: කැබලි අක්ෂර C; බටහිරට: කැබලි අක්ෂර C, එම්. පී. ගුරුගේ හිමිකම් කියන මුතුරාජවෙල, මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය (මා.සං.අ.).

3. කැබලි අක්ෂර '**C**' – **මුතුරාජවෙල – ප්‍රමාණය: හෙක්. 0.5954**
උතුරට: කැබලි අක්ෂර B සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මෙම


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමේ ඉතිරි කොටස ; දකුණට: පිටත වටරවුම් අධිවේගී මාර්ගය, කැබලි අක්ෂර D, එන්. ඩී. කේ. රණසිංහ හිමිකම් කියන ඉදිගහ තුඩුවේ කුඹුර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; බටහිරට: කැබලි අක්ෂර D, එන්. ඩී. කේ. රණසිංහ හිමිකම් කියන ඉදිගහ තුඩුවේ කුඹුර, මෙම ඉඩමේ ඉතිරි කොටස සහ කැබලි අක්ෂර A.

**4. කැබලි අක්ෂර 'D' – ඉදිගහ තුඩුවේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1168**

උතුරට: කැබලි අක්ෂර C ; නැගෙනහිරට: කැබලි අක්ෂර C ; දකුණට: පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ එම්. පී. ගුරුගේ හිමිකම් කියන මුතුරාජවෙල.

03 - 425

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.